Sri Lanka Tourism

Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.
Hotline: 1912 Tel: +94 11 2426800/900, Fax: +94 11 2437953 E-mail: info@srilanka.travel, Web: www.srilanka.travel / www.sltda.gov.lk

2025.12.19 SLTDA/SQA/2024/07/01

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො.353
කෝට්ටේ පාර
රාජගිරිය

**2026 වර්ෂයට අදාළ සුරාබදු බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන්**

2026 වර්ෂයට අදාළව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් එළැඹි තීරණය පහත පරිදි දන්වා එවමි.

1. 2024 හෝ 2025 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද වලංගු ලියාපදිංචියක් හෝ බලපත්‍රයක් ලබාගෙන ඇති සංචාරක සේවා සපයන්නන් සඳහා 2026 වර්ෂයට අදාළ මත්පැන් බලපත්‍ර 2026 මාර්තු 30 දින දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීම. (අදාළ ආයතන ලැයිස්තුව මේ සමග අමුණා ඇත.)

2. 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ බලපත්‍ර අලුත් කිරීම, 2026 මාර්තු 30 දින හෝ ඊට පෙර සිදුකළ යුතු අතර එසේ බලපත්‍ර අලුත් කළ සංචාරක ආයතනයන් සඳහා පමණක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කාලය සඳහා නිර්දේශ නිකුත් කිරීම.

3. 2026 මාර්තු 30 දිනට පෙර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද 2026 වර්ෂයට අදාළ බලපත්‍රය හා සුරාබදු නිර්දේශය ලබාගන්නා ලෙසට සංචාරක සේවා සපයන්නන්හට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ද දැනුම් දීම.

4. සුරාබදු දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කටයුතු ආරම්භයේදීම උක්ත කාරණා සම්බන්ධයෙන් හා ඒ හේතුවෙන් දැරීමට සිදුවන පිරිවැය සම්බන්ධයෙන් සංචාරක සේවා සපයන්නන් දැනුවත් කිරීම.

ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ඔබගේ කඩිනම් ප්‍රතිචාර හා සහයෝගය අපි ඉතා අගය කරමු.

මේ පිළිබඳ යම් තොරතුරු විමසීමක් අවශ්‍ය නම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ, ප්‍රමිති හා තත්ත්ව ආරක්ෂණ වෙතින් ලබා ගත හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමු.

ස්තූතියි.

සභාපති

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පිටපත් :1. ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
2. ගරු අමාත්‍යතුමන්ගේ සම්බන්ධීකරණ ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
3. ගරු නි. අමාත්‍යතුමන්ගේ සම්බන්ධීකරණ ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

} ගරු අමාත්‍යතුමන් දැනුවත් කිරීම සඳහා